# පශ්චාත් වෛද්‍ය උපාධි විද්‍යා ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය

## ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ, පශ්චාත් වෛද්‍ය උපාධි විද්‍යා ආයතනය විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අය වෙතින් 2024.02.29 දින තෙක් අයදුම්පත් භාරගනු ලැබේ.

**ස්ථිර තනතුරු :**

1. සායනික විද්‍යා හා රසායනාගාර විද්‍යා පිළිබඳ කථිකාචාර්ය (පරිවාස), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II/I ශ්‍රේණි
2. වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ-

   කථිකාචාර්ය (පරිවාස), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II/I ශ්‍රේණි

**වැටුප් පරිමාණ :**

අ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය i - ශ්‍රේණිය - රු. 91,310-7X2,170-106,500 මාසිකව u -AC3 (i) 2020.01.01 දිනට

ආ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ii ශ්‍රේණිය - රු. 79,360-11X1,630-97,290 මාසිකව u -AC3 (ii) 2020.01.01 දිනට

ඇ) කථිකාචාර්ය (ස්ථිර නොකළ) -රු. 69,580-5X1,630-77,730 මාසිකව u -AC3 (iii) 2020.01.01 දිනට

ඈ) කථිකාචාර්ය (පරිවාස) - රු. 54,600-10X1,335-67,950 මාසිකව u -AC3 (iv) 2020.01.01 දිනට

ඉහත වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**විශේෂ සටහන් :**

එම් ඩී (MD) සහ මණ්ඩල සහතිකකරණය සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛත්ව හිමිවේ.

විශ්‍රාමික සෞඛ්‍ය අමාත්‍යාංශ උපදේශකයින්ගේ සහ සප්තවාර්ෂික නිවාඩු මත සිටින විශ්වවිද්‍යාල විද්වතුන් ගේ අයදුම්පත් කොන්ත්‍රාත් පදනමින් පත්කිරීම සඳහා සලකා බලනු ඇත.

**සප්තවාර්ෂික නිවාඩුවේ හිමිකම**

ඉහත තනතුරු දරන්නන් වසර හතක සේවාකාලය සම්පූර්ණ කළ විට වැටුප් සහිත වසර එකක හෝ වැටුප් රහිත වසර දෙකක සප්තවාර්ෂික නිවාඩු සඳහා හිමිකම් ලබයි. සප්තවාර්ෂික නිවාඩු මත විදේශ ගත වන්නන් ඔහුට/ ඇයට සහ ඔහුගේ/ ඇයගේ කලත්‍රයාට සම්පූර්ණ වැටුප් ලැබීමට සුදුසුකම් ලබයි.

**වැදගත්**

ඔබගේ වෘත්තිය, අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවන්න.

උසස් අමාත්‍යාංශය ආයතන, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් අදාළ අංශ ප්‍රධානීන් මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවය හා අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

රැකියා විස්තර හා අයදුම්පත ඇතුලු වැඩිදුර විස්තර පශ්චාත් වෛද්‍ය උපාධි විද්‍යා ආයතනයේ වෙබ් අඩවිය **pgim.cmb.ac.lk** වෙතින් ලබාගත හැකිය.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම**

යථා පදිරිදි සම්පූර්ණ කළ අයදුම්පත් අදාළ සහතික පිටපත් සමග **2024.02.29** දින හෝ ඊට පෙර **recruitment@pgim.cmb.ac.lk** ඊමේල් ලිපිනයට ඉදිරිපත් කිරීම හෝ කොළඹ 07, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, නො. 160. පශ්චාත් වෛද්‍ය උපාධි විද්‍යා ආයතනය, නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙත ලියා පදිංචි තැපැලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ යුතුය.

අයදුම් කරන තනතුර ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ හෝ විද්‍යුත් තැපැලේ විෂයය ලෙස සඳහන් කළ යුතුය.

අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**අධ්‍යක්ෂ,**
**පශ්චාත් වෛද්‍ය උපාධි විද්‍යා ආයතනය,**
**නො. 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ -07.**
**2024.02.05**